# 1.10 සච්චිදානන්ද් හීරානන්ද් වාත්ස්‍යායනගේ නවකතා පිළිබඳ විමර්ශනයක්

ඉන්ද්‍රා කුමාරි දසනායක
හින්දී අධ්‍යයන අංශය කැලණිය, විශ්වවිද්‍යාලය, කැලණිය.

## ABSTRACT

නූතන හින්දී කතා කලාවට පුරෝගාමී මෙහෙවරක් ඉටු කළ සච්චිදානන්ද් හීරානන්ද් 'අග්ගේය' යන උපනාමයෙන් ලේඛන කලාවේ නිරත විය. ඔහු මිනිස් මනෝභාවයන්ගේ චංචලත්වය හා එහි ස්වභාවය මානව සමාජය කෙරෙහි බලපාන ආකාරය පිළිබඳ ව යථාරූපී විග්‍රහයක නියැළීමට උත්සාහ දැරුවේ ය.

මානව ජීවිතයේ යථාර්ථය නිරූවත් කර එය කලාත්මක ව ගොනු කොට 'කලාව කලාව උදෙසා නොව කලාව මිනිසා උදෙසා ය' යන මතය ධ්වනිත කිරීමට ඔහු ස්වකීය නවකතාව මාධ්‍ය කොට ගත්තේ ය. 'යථාරූපී ලෙස මානව ජීවිතය චිත්‍රණය කිරීම' ප්‍රබන්ධ කථාවෙන් සිදුවිය යුතු මුඛ්‍යතම කාර්යය විය. එය එලෙස ම ඇදහූ අග්ගේය අපරදිග මනෝ විද්‍යාඥ සිග්මන් ෆ්‍රොයිඩ්ගේ නියමයන් පදනම් කරගෙන තමාට ම ආවේණික වූ ශිල්පීය සිද්ධාන්ත මත පිහිටා ඔහු සිය නවකතාවේ වස්තුවිෂය වෙනසකට භාජනය කළේ ය. එහි ප්‍රතිඵලයක් හැටියට ඔහුගේ නවකතා පුද්ගලබද්ධ විය. චරිත නිරූපණය බොහෝ විට සිදුවූයේ ෆ්‍රොයිඩ්ගේ මනෝවිද්‍යාත්මක සිද්ධාන්ත පදනම් කරගෙන ය. එහෙයින් ඔහුගේ නවකතා උත්තම පුරුෂ දෘෂ්ටිකෝණගත විය.

විඥානධාරා සන්දර්භය පාදක කොටගෙන ඔහු මනුෂ්‍ය ස්වභාවයේ අනුවේදනීය තත්ත්වය නිරාවරණයට යොදාගත් උපක්‍රම සිද්ධාන්ත සමුදායක් ඔස්සේ විග්‍රහ කර ඇත.

01. ස්වප්න සිද්ධාන්තය
02. උදාහරණ සිද්ධාන්තය
03. විශ්ලේෂණ සිද්ධාන්තය
    i. අනපේක්ෂිත විශ්ලේෂණය
    ii. ආත්ම විශ්ලේෂණය
04. සංවාද සිද්ධාන්තය
05. වර්ණනා සිද්ධාන්තය
06. සංකේත සිද්ධාන්තය
07. ප්‍රත්‍යාවලෝකන සිද්ධාන්තය
08. පත්‍රාත්මක ශෛලි සිද්ධාන්තය

මෙහි දී මූලික ව සලකා බැලෙනුයේ අග්ගේයගේ චරිතවල අන්තර්ගත වන සංකීර්ණ මනෝභාව නිරූපණය සහ එය සාර්ථක කරගැනීමට ඔහු දැරූ ප්‍රයත්නය පිළිබඳ සියුම් විග්‍රහයකි.

**ශේඛර් ඒක් ජීවනී (ශේඛර්ගේ ජීවිතය)**

ඔහුගේ ප්‍රථම හින්දී නවකතාව වන ශේඛර් ඒක් ජීවනී (ශේඛර්ගේ ජීවිතය) මගින් කතුවරයා උත්සාහ දරන්නේ ශේඛර් සිය ජීවිතයේ දී විඳින සහ විඳවන ඛේදනීය අත්දැකීම් අනුසාරයෙන් සිය මනෝභාවයන් සංසරණය වන ආකාරය විදහා පෑමට ය. ඒ සමග ම කතානායකයාට අමතර ව කතානායකයාගේ මනෝභාව තීව්‍ර කිරීමට දායක වන අවශේෂ චරිතවල මනෝභාවයන් ද කතාව ඔස්සේ ද්විතීයික ව දිව යයි.

**නදී කේ ද්වීප් (නදියේ දූපත්)**

ප්‍රේමය, වෛරය, ඊර්ෂ්‍යාව, දුක, සතුට, ඉච්ඡාභංගත්වය ආදි මනෝමූලික මාධ්‍යයන් ඉතා සියුම් ව විශ්ලේෂණය කරන සුවිශේෂ වූ නවකතාවකි. එම නවකතාවේ ද කැපී පෙනෙන විශේෂත්වය වනුයේ චරිත ප්‍රධානගත වීමයි. එහි කතානායක චරිතයත් සමග විකාශනය වන සෙසු චරිත කිහිපයක් ද නිරූපණය වේ. එම නවකතාවේ එන භුවන් සමාජයේ පිළිගත්, විද්වත් චරිතයක් වන අතර ඔහු අපේක්ෂා කරන නිදහස් ජීවිතය නවතාව පුරා ම දිව යයි. කතුවරයා අපේක්ෂා කරන ප්‍රධාන චරිතයේ කතාව සාර්ථක ව දිගහැරීමට ඔහු රේඛා නම් උප ප්‍රධාන චරිතය උපයෝගී කරගනියි. ඇය සාම්ප්‍රදායික අදහස් - උදහස්වලින් තොර නිදහස් ජීවිතයක් පිළිබඳ සිහින දකින විවාහක කතකි.

ප්‍රස්තුත විමර්ශනයේ අරමුණ වී ඇත්තේ අග්ගේයගේ සිය අභිමත අරමුණ විශ්ලේෂණය වී ඇති ආකාරය පිළිබඳ ව විමර්ශනාත්මක දෘෂ්ටියක් හෙළීම සහ ඔහුගේ සිද්ධාන්තමයව විශ්ලේෂණය මගින් මනෝ විශ්ලේෂණාත්මක චරිත නිරූපණයක් සිදු වී ද යන්න සාකච්ඡා කිරීම ය.